SRI LANKA

histories
that
connect

සබැඳි ඉතිහාසය
இணைந்த வரலாறுகள்



## යටත් විජිත සමයේ දැක්ම තුළින්

# ඇතුන් සහ සොබා දහමේ ආධිපත්‍ය

## සත්ව අධ්‍යන දෘෂ්ටිකෝණයකින්

පවන් විජේසිංහ, ඇන්ඩ්‍රියාස් හෝල්ට්බර්ගෙට් සහ සුසැන් පොප්

COLLECTIVE FOR HISTORICAL DIALOGUE & MEMORY
EuroClio Inspiring History and Citizenship Educators
SCOPE Strengthening Social Cohesion and Peace in Sri Lanka
Co-funded by the European Union
german cooperation DEUTSCHE ZUSAMMENARBEIT
Implemented by: giz Deutsche Gesellschaft für Internationale Zusammenarbeit (GIZ) GmbH

# ACKNOWLEDGEMENTS

**Authors**

Pawan Wijesinghe, Prof. Susanne Popp, Andreas Holtberget

**Published by**

EuroClio - European Association of History Educators as part of the project *Histories that Connect Sri Lanka II*

**Copyright**

CC BY 4.0

**To cite this publication:**

Wijesinghe, P., Popp, S & Holtberget, A. (2025). Through the Colonial Gaze: The Elephants of Ceylon and the Domination of Nature – An Animal Studies Perspective. *EuroClio - European Association of History Educators*.

**Supported by**

*This publication was supported by the Strengthening Social Cohesion and Peace in Sri Lanka (SCOPE) programme. SCOPE is co-funded by the European Union and the German Federal Foreign Office and implemented by GIZ in partnership with the Government of Sri Lanka. The content of the publication does not represent the official position of the European Union, the German Federal Foreign Office, GIZ, or the Government of Sri Lanka.*

## හැඳින්වීම

පළමු ද්විත්ව පාඩම : අලි ඇතුන් කෙරෙහි යටත්විජිත දැක්ම

දෙවන ද්විත්ව පාඩම : යටත්විජිත දැක්ම සහ සත්ව අධ්‍යනය

## මානව කේන්ද්‍රවාදය, ඓතිහාසික චින්තනය සහ යටත් විජිතවාදයේ ඉතිහාසය

1. මානව කේන්ද්‍රවාදය යනු කුමක්ද?
2. ඓතිහාසික චින්තනය තුළ මානව කේන්ද්‍රවාදය
3. මානව කේන්ද්‍රවාදය සහ යටත් විජිතවාදය
4. සත්ව ඉතිහාසයː මානව කේන්ද්‍රීය (මානව කේන්ද්‍රීය) ලෝක දැක්මට අභියෝග කිරීම සහ ඓතිහාසික චින්තනය
5. යටත් විජිත සංචාරකයින්ගේ ලේඛන සටහන
6. අද දවසේදී මෙය වැදගත් වන්නේ ඇයි?

## සැමුවෙල් වයිට් බේකර් සහ ඔහුගේ සංචාරක සටහන් පිළිබඳ හැඳින්වීම

## කෙටි උපුටා ගැනීම්

උපුටා ගැනීම 01ː බර වැඩ කිරීම සඳහා යොදා ගන්නා තිරිසන් සතුන් ලෙස අලි ඇතුන්

උපුටා ගැනීම 02ː අලි දඩයම

උපුටා ගැනීම 03ː වෙළඳ භාණ්ඩයක් ලෙස අලිඇතුන්

උපුටා ගැනීම 04ː භයානක තිරිසන් සත්වයෙකු ලෙස අලියා

## ඇමුණුම 1ː දෘශ්‍ය මූලාශ්‍ර

# හැඳින්වීම

අප යටත් විජිත ඉතිහාසය අධ්‍යනය කරනවිට මානව සමාජයන් කෙරෙහි එහි බලපෑම පමනක් නොව,සොබාදහමට හා සතුන්ට එයින් ඇති වූ බලපෑමද අධ්‍යනය කරනවිට කුමක් වියහැකිද? මෙම අන්තර්ක්ෂේත්‍ර අධ්‍යන ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් ශිෂ්‍යන් හට මානව කේන්ද්‍රීය දෘෂ්ටිකෝණයකින් විතැන් වී සතුන්, විශේෂයෙන් අලි ඇතුන්, යටත් විජිත බලයේ සහ ආධිපත්‍යයේ ව්‍යුහයන් තුළට ඇද ගත් ආකාරය ගවේෂණය කිරීමට ආරාධනා කරයි. 19 වන සියවසේ ලංකාව (සිලෝන් - වර්තමානයේ ශ්‍රී ලංකාව) ගැන ලියැවුනු බ්‍රිතාන්‍ය සංචාරක ලේඛන කෙරෙහි අවධානය යොමු කරමින්, අලි ඇතුන් යනු කුතුහලය දනවන අමුතු සත්ව කොට්ඨාෂයක් ලෙස හෝ ශ්‍රමය සඳහා භාවිත කළ සතුන් ලෙස පමණක් නොව, සංකීර්ණ සංකේතයක් ලෙස අලි ඇතුන් යටත් විජිත ලෝක දෘෂ්ටිය තුළ නිරූපණය කර ඇති ආකාරය සිසුන් විශ්ලේෂණය කරනු ඇත. සත්ව අධ්‍යයනය යන දෘෂ්ටිය භාවිතා කරමින්, මෙම ඒකකය සිසුන්ට ඓතිහාසිකව ගොඩනගා ඇති ආඛ්‍යාන පිලිබඳ නැවත සිතා බැලීමටත්, මානවයා හා සත්වයා පිලිබඳ වූ පැටලීම් අනාවරණය කර ගැනීමට සහ යටත් විජිත බැල්ම අදටත් ,පාරිසරික හා සදාචාරාත්මක විවාදවලට බලපාන ආකාරය ගැන සිතා බැලීමටත් අභියෝග කරයි.

ද්විත්ව පාඩම් දෙකක් හරහා, ඉගෙන ගන්නන් විසින් පුළුල් පරාසයක විහිදුනු මූලාශ්‍ර - පෙළ, රූප - සහ නිර්මාණාත්මක කාර්යයන් - සමඟ සම්බන්ධ වී ඓතිහාසික චින්තනය සහ විවේචනාත්මක සංවේදනය යන දෙකම වර්ධනය කරගනියි. අලි ඇතුන් පිළිබඳ යටත් විජිත විස්තරවල පිළිබිඹු වන බල ව්‍යුහයන් මොනවාද? යටත් විජිතවාදියාගෙන් යටත් විජිතකරණයට, මිනිසාගෙන් සත්වයාට යන ලෙස දෘෂ්ටිකෝණයන් අපි විතැන් කරන විට කතාව වෙනස් වන්නේ කෙසේද? ලෙස අසන්නට මෙමගින් ඔවුන්ව දිරිමත් කරයි.

පාද සටහන: උදාහරණයක් ලෙස අලියා තෝරා ගන්නාවිටම එය යටත් විජිතයේ සුලබ උපක්‍රමයක් අනුගමනය කිරීමක් බව අප දනිමු. කෙසේ නමුත්, අප ගත් තීරණය පදනම් වූයේ උපදේශාත්මක සලකා බැලීම් මතය. ප්‍රථමයෙන්ම සිසුන්ගේ පරිකල්පනයට ඉතා පහසුවෙන් හා වැඩි සම්භාවිතාවකින් අලියාට ඇතුළු විය හැකිය. දෙවනුව, යටත් විජිතයන්හි "විදේශීය" සතුන් කෙරෙහි පැවති යටත් විජිත ආකල්පවල විවිධාකාර වූ අංශ ඉස්මතු කිරීමට එය අපට ඉඩ සලසා දෙනු ලබයි.

**ශ්‍රේණියේ මට්ටම:** 11
**කාලය:** ද්විත්ව පාඩම් 2 (එකක් මිනිත්තු 80-90 අතර වූ කාලයක්)
**ප්‍රධාන තේමාවන්:**

- සතුන් පිලිබඳ යටත් විජිත සංජානනය ගැන විශ්ලේෂණයක්- විශේෂයෙන් අලි ඇතුන් පිළිබඳ බ්‍රිතාන්‍ය - ලංකා (සිලෝන්-වර්තමාන ශ්‍රී ලංකාව) සංචාරක වාර්තා ඔස්සේ.
- ලංකාවේ මිනිසුන්, සතුන් සහ සොබාදහම සම්බන්ධයෙන් 'යටත් විජිත දැක්ම' පිළිබඳව සිදුකරන ආවර්ජනයක්.
- 19 වන සියවසේ යටත් විජිත සංචාර යනු, දැනුම පුළුල් කිරීමේ මාධ්‍යයක් ලෙස සහ අධිරාජ්‍ය ගවේෂණය සහ සූරාකෑම සඳහා මෙවලමක් යන දෙයාකාරයෙන්ම භාවිතා වීම අවබෝධ කර ගැනීම.
- යටත් විජිත සංචාරක වාර්තා වලින් අලි ඇතුන් පිලිබඳ යටත් විජිත දැක්මට අදාළ මූලාශ්‍ර පරීක්ෂා කිරීම.
- සත්ව අධ්‍යයන දැක්ම හරහා මානව කේන්ද්‍රවාදය හැඳින්වීම.

### ඉගෙනීමේ අරමුණු

සිසුන්ට හැකි විය යුතු දෑ

1. මිනිසුන්, සතුන් සහ යටත් විජිත පාලනය අතර සම්බන්ධතා විමර්ශනය කිරීම තුළින් සතුන් සහ මිනිසුන් යන දෙකොට්ඨාශයම යටත් විජිත ධුරාවලීන්ට යටත් වූ ආකාරය හඳුනා ගැනීම.
2. යටත් විජිත සංචාරවල දෙබිඩි ස්වභාවය හඳුනා ගැනීම, යටත් විජිත සංචාර වාර්තාවල සඳහන් නව භූමි ප්‍රදේශ ගවේෂණය කිරීමේ මාධ්‍යයක් සහ ආර්ථික හා උපායමාර්ගික අවශ්‍යතා තක්සේරු කිරීමේ මෙවලමක්, යන දෙයාකාරයෙන්ම ක්‍රියාත්මකවූ ආකාරය තේරුම් ගැනීම.
3. යටත් විජිත සමයේ දඩයම් පිලිබඳ ගවේෂණවල කාර්යභාරය විශ්ලේෂණය කිරීමෙන්, අලි දඩයම් කිරීම, බලය සහ යටත් විජිත කීර්තිය ප්‍රදර්ශනය කිරීමක් ලෙස සේවය කළ ආකාරය පරීක්ෂා කිරීම.
4. ශ්‍රී ලාංකික අලි ඇතුන් ගැන චිත්‍රය ගොඩනගා ඇති අයුරු හරහා මානව කේන්ද්‍රීය සහ යටත් විජිත චින්තනය අතර සම්බන්ධතාවය තේරුම් ගැනීම.
5. ඓතිහාසික මූලාශ්‍ර විශ්ලේෂණය කිරීමටත්, යටත් විජිතවාදීන්ගේ ලෝක දැක්ම තුළ මානව කේන්ද්‍රීයවාදය අනාවරණය කර ගැනීමටත් 'සත්ව අධ්‍යයන' ප්‍රවේශය භාවිතා කරන්න.

# පළමු ද්විත්ව පාඩම: අලි ඇතුන් කෙරෙහි යටත්විජිත දැක්ම

### හැඳින්වීම (මිනිත්තු 15) - ඡායා රූප විශ්ලේෂණය සහ සාකච්ඡාවට ගැනීම තුළින්

**හැඳින්වීම: ඓතිහාසික ලංකාවේ සහ වර්තමාන ශ්‍රී ලංකාවේ අලි ඇතුන් ගැන අපට ඡායාරූප හරහා හෙලිදරව් වන්නේ මොනවාද?**

1. ලංකාවෙන් යුරෝපීය සත්වෝද්‍යාන වෙත අලි ඇතුන් පිටුවහල් කිරීම.
2. යටත් විජිත ආධිපත්‍යයේ කොටසක් ලෙස අලි දඩයම / ජයග්‍රාහී කුසලානයක් වෙනුවෙන් දඩයම් කිරීම.
3. අතීතය සහ වර්තමානය: ශ්‍රී ලංකාවේ ආගමික උත්සවවලදී අලි ඇතුන්ගේ භූමිකාවන්.
4. අද වන විට: අලි ඇතුන් කෙරෙහි සංචාරකයින්ගේ ආකර්ශනය - අඛණ්ඩව පවතින්නේ හෝ වෙනසක් සිදුව තිබේද?

**සාකච්ඡාවට බඳුන් කල හැකි ප්‍රශ්න:**

1. ඔබ විසින් නිරීක්ෂණය කරන්නේ කුමක්ද? මෙම ඡායාරූපවල පෙන්නුම් කෙරෙන අලි ඇතුන් මෙහි ඉටු කරන භූමිකාවන් මොනවාද?
2. ඔබ සිතන්නේ කුමක්ද: මෙම රූප නිර්මාණය කළේ කවුද? කවුරුන් සඳහාද? කුමන අරමුණු සඳහාද?
3. දේශීය ජනයා සහ යටත් විජිතවාදීන් අතර අලි ඇතුන්ගේ නියෝජනය පිලිබඳ අදහස වෙනස් වන්නේ කෙසේද?
4. ඓතිහාසික ලංකාවේ ජීවත්වූ ජනයා ඉහත කී කාරනයම ඔවුන්ගේ දෘෂ්ටිකෝණයට අනුව විස්තර කර ඇත්තේ කෙසේද?
5. අද ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ට/අමුත්තන්ට අලි ඇතුන් පිළිබඳව ඇති දැක්ම දේශීය ජනතාවගේ දැක්මට වඩා වෙනස් විය හැක්කේ කෙසේද?

- අවශ්‍ය කරුණු සපයා ගැනීම: ශ්‍රී ලංකාවේ අලි ඇතුන් පිලිබඳ විස්තර කරන බ්‍රිතාන්‍ය සංචාරක සටහන් වලින් (19 වන සියවස) කළ උපුටා ගැනීම් සහ සැමුවෙල් වයිට් බේකර් සහ ඔහුගේ සංචාරක සටහන් වල ආරම්බක හැඳින්වීමේ සටහන් තුළින් [1]

- කණ්ඩායම් වැඩ - සෑම කණ්ඩායමක්ම නිශ්චිත තේමාවක් කෙරෙහි අවධානය යොමු කරයි:
  1. යටත් විජිත සංචාරයන් තුළින් පිළිබිඹු වන ද්විත්ව ස්වභාවය:
     - සංචාරකයා ඔහුගේ ගමන විස්තර කරන්නේ කෙසේද?
     - ප්‍රදේශවාසීන්, සතුන් සහ සොබාදහම කෙරෙහි කුමන අයුරක ආකල්පයක් දරන්නේද යන්න මූලාශ්‍රවලින් පිළිබිඹු වේද?
     - සමකාලීන යුරෝපයේ තත්වය ගැන වාර්තා තුලින් පවසන්නේ කුමක්ද?
     - ආර්ථිකමය, හමුදාමය හෝ උපායමාර්ගික අවශ්‍යතා පිළිබඳ මින් අඟවන්නේද?

  2. ලංකාවේ අලි ඇතුන් පිළිබඳ යුරෝපයේ නිරීක්ශනය:
     - අලි ඇතුන් පිලිබඳව  විස්තර කිරීමට භාවිතා කරන විශේෂණ සහ රූපක මොනවාද?
     - අලි ඇතුන් පිලිබඳ අදහස සමාජගත් වී ඇත්තේ කුමන අයුරකින්ද? විදේශයක සිට මෙරටට ආ සත්වයෙක්, යම් කිසි පූජනීයත්වයකට උරුම කම් කියන සත්වයෙක් හෝ වෙනත් ලෝකයකින් ආ සත්වයෙක් ලෙස ද?.
     - ඉහත රූප සමඟ වාර්තාමය කරුනු සසඳන්න: මෙහි කිසියම් පොදු ලක්ෂණයන් සහ වෙනස්කම් තිබේද?

  3. යටත් විජිත සමයේ සිදුවූ දඩයම් පිලිබඳව ගවේෂණය කිරීමේදී හෙලිවන තොරතුරුවලින් සිදුවන කාර්යභාරය:
     - අලි දඩයම සම්බන්ඳව විස්තර ඉදිරිපත් කරන්නේ කෙසේද? කතුවරයා අලි දඩයම පිලිබද කාරනය වටහා ගන්නේ කෙසේද සහ ඔහු ඒ සමඟ සම්බන්ධ කරන වටිනාකම් මොනවාද?
     - දඩයම්කරුවන් සහ අලි ඇතුන් පිලිබඳ හැඳින්වීමට ඔවුන් භාෂාව වෙනස් ලෙස භාවිතා කරන්නේ කෙසේද?
     - දඩයම් කිරීම හරහා ,යටත් විජිත පුරුෂභාවය සහ අධිකාරී බලය ශක්තිමත් කරන්නේ කෙසේද?

[1] විකල්පයක් ලෙස, පහත වීඩියෝවේ 7:50-14:40 දක්වා කොටසේ බේකර්ගේ ලංකාවේ ජීවිතය පිළිබඳ විස්තරයක් ලබා දී ඇත (සිංහල භාෂාවෙන් පමණි): https://www.youtube.com/watch?v=eSLr-fsG6OY

## දෙවන අදියර (මිනිත්තු 30 ) ඉදිරිපත් කිරීම සහ සාකච්චා කිරීම

- කණ්ඩායම් විසින් තමන් සොයාගත් තොරතුරු පෝස්ටර් භාවිතා කරමින් ඉදිරිපත් කරයි.
- පන්ති සාකච්ඡාව:
  - » එකිනෙකට වෙනස් වූ වාර්තාමය තොරතුරු හරහා ඉස් මතුවන රටා මොනවාද?
  - » මෙම නියෝජනය වන කරුනු තුළින් යටත් විජිත සමයේ බල ව්‍යුහයන් ගැන අදහස පිළිබිඹු කරන්නේ කෙසේද?
  - » යටත් විජිත සමයේ සංචාරකයන්ට වඩා වෙනස් ලෙස මේ භූමියේ ප්‍රදේශවාසීන් අලි ඇතුන් දකින්නේ කෙසේද?[2]

## නිගමනය (මිනිත්තු 15)- යමක් දෙස බලන ආකාරය වෙනස් කිරීම (ලිවීමේ කාර්ය හෝ ඒ තුළ වෙනත් භූමිකාවක් නිරූපනය කරන්න ඇත්ද යන දෙකෙන් එකක් තෝරාගන්න)

- ලිවීමේ කාර්ය: විකල්ප දෘෂ්ටිකෝණයකින් බලා ශිෂ්‍යන් කෙටි වේදයක් ලිවීම.
  - » ලංකාවේ අලි බලාගන්නෙකු (ඇත්ගොව්වෙකු) අලි ඇතුන් සමග ගතවෙන දවසේ රාජකාරී වැඩ පිලිබඳ විස්තර කරයි.
  - » අලියෙක් තමන්ගේම කතාව කියයි. (තමන් කරන වැඩ ගැන, වහලෙකු ලෙස ගතකරන ජීවිතය ගැන, අලි දඩයම ගැන)
  - » බ්‍රිතාන්‍යන් විසින් සතුන් දඩයම් කරමින් යන ගමන ගැන ලංකාවේ ප්‍රාදේශීය ගැමියෙකුගේ දෘෂ්ටිකෝණයකින්.

- නිරූපනය කිරීමට ඇති භූමිකාව: අලි ඇතුන් ගැන කතා කරන්නේ කව්ද?
  සපයා ඇති දත්ත,තොරතුරු හා ඔවුන් විසින් සිදු කළ පර්යේෂණ මත පදනම්ව සෑම සිසුවෙක්ම වෙනස් භූමිකාවක් භාරගනියි.
  1. බ්‍රිතාන්‍ය සංචාරකයා.
  2. ශ්‍රී ලංකාවේ අලි බලාගන්නා/ හසුරුවන්නා (ඇත්ගොව්වා).
  3. යටත් විජිත සමයේ මහාපරිමාණයෙන් තරඟයට මෙන් දඩයම් කළ දඩයක්කරුවන්.
  4. අලියෙක්.

- කාර්යය: සෑම චරිතයක්ම අලි දඩයම් කිරීමක් ගැන හෝ අලින්ගෙන් වැඩ ගැනීමක් ගැන යම් කිසි දර්ශනයක් ඔවුන්ගේ දෘෂ්ටිකෝණයකට අනුව විස්තර කරයි.

- මේ තුළින් අවබෝධ කරගතහැකි දේ: එකිනෙකාගේ දෘෂ්ටිකෝණය අනුව ඉදිරිපත් කරන විස්තර වෙනස්වන්නේ කෙසේද?

[2] ගුරුවරුන් සඳහා වූ සටහන: කරුණාකර පහත සඳහන් කරුණු පිලිබඳ සළකා බලන්න:
අලි ඇතුන් පූජනීයත්වයෙන් යුතු සතුන් ලෙස, අලි ඇතුන් පීඩාකාරී සත්ව කොට්ඨාශයක් ලෙස (බව භෝග විනාශ කිරීම, ගම්මාන ආක්‍රමණය කිරීම ආදිය), අලි ඇතුන් වෙළඳ භාණ්ඩයක් ලෙස (ඇත්දළ), අලි ඇතුන් රාජකීයත්වයේ සංකේතයක් ලෙස.

# දෙවන ද්විත්ව පාඩම : යටත්විජිත දැක්ම සහ සත්ව අධ්‍යනය

**හැඳින්වීම (මිනිත්තු 10) - භූමිකාවන් නිරූපණය කිරීම තුළින් (හෝ ලිවීමේ කාර්ය තුළින්) පිළිඹිබු වන දෑ.**

1. අලි ඇතුන් ගැන කතා කරන්නේ කවුද?
2. එකිනෙකාගේ දෘෂ්ටිකෝණය අනුව ඉදිරිපත් කරන විස්තර වෙනස් වෙන්නේ කෙසේද?

**පලමු අදියර:**

**සත්ව අධ්‍යනය යන අදහසට පලමු ප්‍රවේශය ලබාගැනීම - මානව කේන්ද්‍රීය චින්තනයට අභියෝග කිරීම**

- අවශ්‍ය කරුණු සපයාගැනීම: "මානව කේන්ද්‍රීයවාදය, ඓතිහාසික චින්තනය සහ යටත් විජිතවාදයේ ඉතිහාසය" යන කරුණුවල හදුන්වාදීමේ මූලාශ්‍ර ඔස්සේ.
  - කෙටි දේශනය/සාකච්ඡාව:
    - » "සත්ව අධ්‍යයනය" යනු කුමක්ද? මානව කේන්ද්‍රවාදය යනු කුමක්ද? මේ සංකල්ප දෙක එකිනෙකට සම්බන්ධ වන්නේ කෙසේද සහ ඒවා යටත් විජිත ලෝක දෘෂ්ටියට අදාල වන්නේ කෙසේද?
    - » ඔබේ අදහස කුමක්ද: සතුන් යනු ඉතිහාසයේ සිට එන ඓතිහාසික නියෝජිතයන් ලෙස අප සැලකිය යුතුද?
    - » ඔබේ අදහස කුමක්ද? ඉතිහාසයේ පටන් මිනිසුන් සහ සතුන් යන දෙකොට්ඨාශය අතර එකිනෙකා කෙරෙහි විරුද්ධත්වයක් තිබුනාද?

  - කණ්ඩායම් සඳහා කාර්යය
    - » පෙර විශ්ලේෂණය කරන ලද යටත් විජිත මූලාශ්‍ර සඳහා සිසුන් විසින් සත්ව අධ්‍යන ප්‍රවේශය භාවිතා කරයි.
    - » අලි ඇතුන් යනු ඓතිහාසික භූමිකාවක් රඟදැක්වූ සත්ව කොට්ඨාශයක් ලෙස සැලකුව හොත් මෙම කරුණුවල අර්ථ නිරූපණය වෙනස් වන්නේ කෙසේද?

**දෙවන අදියර (මිනිත්තු 30 පමණ) - යටත් විජිත සමය සම්බන්ධ කරමින් රචනා කර ඇති දෑ නැවත ලිවීම**

- කාර්යය: සිසුන් විසින් යටත් විජිත සංචාරක සටහනක් නැවත ලියයි. මෙහිදී පෙර යටත් විජිත දෘෂ්ටිකෝණයෙන් බලා ලියූ විධික්‍රමය බැහැර කරයි. මෙවර වඩා සත්ව කේන්ද්‍රීය වූ හෝ දේශීය දෘෂ්ටිකෝණයක් භාවිතයට ගනියි.

- සම වයස් මිතුරන් සමග හුවමාරු කරගැනීම: සිසුන් එකිනෙකා විසින් නැවත සංශෝධනය කරමින් ලියූ සටහන් කුඩා කණ්ඩායම් වශයෙන් කියවා සාකච්චාවට බදුන් කරයි.

**නිගමනය (මිනිත්තු 15) - සාකච්ඡා කිරීම සහ ඉන් පිලිඹිබු වන දේ**

- අවසාන සාකච්ඡාව
  - ඉතිහාසයේදී සතුන් ගැන අපි කතා කළේ කුමන ආකාරයෙන්ද යන්න වැදගත් කාරණයක් වන්නේ ඇයි?
  - යටත් විජිතකරණය නොවූ ඉතිහාසය තුළට සතුන් සහා සොබාදහම ඇතුලත් කරගත හැක්කේ කෙසේද?

# මානව කේන්ද්‍රවාදය, ඓතිහාසික චින්තනය සහ යටත් විජිතවාදයේ ඉතිහාසය

## සිසුන් සහ ගුරුවරුන් සඳහා පෙළපොතක්

### 1. මානව කේන්ද්‍රවාදය යනු කුමක්ද?

මානව කේන්ද්‍රවාදය යන වචනයේ පළමු කොටස පුරාණ ග්‍රීක "ඇන්ත්‍රොපොස්" යන වචනයෙන් මූලාරම්බ වන අතර එහි අර්ථය වන්නේ "මනුෂ්‍ය" යන්නයි. හිතලා බලන්න, මේ ලෝකයේ වඩා වැදගත්ම ජීවීන් කොට්ඨාශය මිනිස්සු කියලා කවුරු හරි විශ්වාස කරලා තියනවනම්, සතුන්,වනාන්තර,සාගර ඇතුළු අනෙක් සියල්ල පවතින්නේ මිනිසුන්ට පාවිච්චි කිරීමට කියලා හිතලා තියනවනම්, ඒ තුළින් මතුවෙන අදහස තමයි 'මානව කේන්ද්‍රවාදය. කියලා කියන්නෙ.

- සෑම දෙයකම කේන්ද්‍රස්ථානය වන්නේ මිනිසුන්ය.
- සොබා දහම මිනිස්සුන්ට වඩා පහල මට්ටමකින් පවතින අතර එය පාලනය කිරීමට හෝ සූරාකෑමට ඔවුන්ට හැකිය.
- සතුන්,ශාක හා භූමිය පවතින්නේ මිනිස් අවශ්‍යතා සපුරාලීම සඳහා පමනක් වන අතර, ඒවාට ඔවුන්ට අනන්‍ය වූ ජීවීන් කොට්ඨාශයක් ලෙස වටිනාකමක් නැති අතර, ඒවා හුදු මෙවලම් හෝ සම්පත් ලෙස පමනක් සළකනු ලබයි.

**මානව කේන්ද්‍රවාදය පැමිණෙන්නේ කොහෙන්ද?**

බටහිර සම්ප්‍රදායන් තුළ මානව කේන්ද්‍රවාදයට ගැඹුරු මූලයන් පිහිටා ඇත. මෙහි ඇතැම් ප්‍රධාන බලපෑම් කීපයක් ඇතුලත් කොට ඇත.

- යුදෙව්-ක්‍රිස්තියානි විශ්වාසයන්: උදාහරණයක් ලෙස, බයිබලයේ උත්පත්ති පොත මගින්, මිනිසුන්ට ස්වභාවධර්මය කෙරෙහි 'ආධිපත්‍යයක්' ඇති බව විස්තර කරයි. සොබාදහම පවතින්නේ මිනිසාගේ භාවිතය සඳහා බවට යන අදහස ශක්තිමත් කරයි.

- යුරෝපීය බුද්ධිමය විලඹුම (1600 - 1800 සියවස්): යුරෝපීය චින්තකයින් සොබාදහම කෙරෙහි අවධාරණය කරන කරුණක් වන්නේ හේතුවක්,ප්‍රගතියක් සහ පාලනයක් සොබාදහම මත පැවතිය යුතු බව මෙන්ම එය ජයගත යුතු හා තම අභිමතය පරිදි හීලෑකර ගතයුතු දෙයක් ලෙස ඔවුන් සැළකූ බවත්ය.
- කාර්මිකකරණය, ධනවාදය සහ තාක්ෂණය: මෙම බලවේග විසින් ස්වභාව ධර්මය යනු සම්පතක් ය යන කාරණය ඔස්සේ සිතා බැලීමට මිනිසාව දිරිමත් කරනු ලබයි. මෙහිදී සතුන්, වනාන්තර, ගංගා සහ ස්වාභාවික සම්පත් යනු කර්මාන්තශාලාවල කාර්මික නිෂ්පාදනය සහ ආර්ථික ලාභය සඳහා භාවිතා කළ යුතු අමුද්‍රව්‍ය ලෙස සලකනු ලැබීය.
- නමුත් මානව කේන්ද්‍රවාදය යනු තනිකරම බටහිරින් පැමිණි සංකල්පයක්ද? නෑ.සම්පූර්ණයෙන්ම නෙමෙයි. බටහිර සමාජය විසින් යටත් විජිතවාදය සහ ගෝලීයකරණය හරහා මෙය තනිකරම ඔවුන්ගේ සංකල්පයක්ය යන අදහස දැඩි ලෙස ශක්තිමත් කර ව්‍යාප්ත කර තිබුනත්, විවිධ සංස්කෘතීන්ට මේ පිලිබඳ විවිධ දෘෂ්ටිකෝණයන් තිබුණි.
- බොහෝ දේශීය සංස්කෘතීන්, බෞද්ධ සම්ප්‍රදායන් හා ඩාඕවාදී දර්ශනයන් තුළ අවධාරණය කරනු ලබන කරුනක් නම් සොබා දහම පාලනය කරනවාට වඩා එය සමග සමගියෙන් ජීවත් විය යුතු බවයි.
- ඇස්ටෙක්වරුන් සහ චීන අධිරාජ්‍යයන් වැනි සමහර පුරාණ ශිෂ්ටාචාර ද ඔවුන්ගේ පරිසරයන් යම් අයුරකින් හැඩගස්වා ගත් නමුත් බොහෝ විට වූයේ ඒ මත ආධිපත්‍යයක් පතුරනවාට වඩා, සොබා දහමත්,ඔවුනුත් එකිනෙකා මත යැපෙමින් ජීවත් විය යුතුයි යන හැඟීමකින් කටයුතු කිරීමකි.

## 2. ඓතිහාසික චින්තනය තුළ මානව කේන්ද්‍රවාදය

- වනාන්තරයක දෘෂ්ටිකෝණයෙන් බලා ඉතිහාසය ගැන පැවසුවහොත් එය කුමන ආකාරයකින් යුක්ත වෙයිද?
- සතුන් විසින් මිනිස් ඉතිහාසය හැඩගස්වා ඇත්තේ කෙසේද?

ඓතිහාසික චින්තනය තුළ මානව කේන්ද්‍රවාදය පිලිබඳ ප්‍රකාශ කරනු ලබන කතන්දරයේ ගැබ්ව ඇත්තේ, මිනිසා යනු අනික් සියලු දේටත් වඩා සැලකුම් ලැබිය යුතු චරිතයක් බවත්, සතුන්,භූ දර්ශන,දේශගුණය හා ස්වභාවික සම්පත් යන අන් සියල්ල ඊට පසුබිමින් පිහිටා ඇති දේ බවත් ය.කෙසේ නමුත් මානව ඉතිහාසය සෑමවිටම සොබා දහම හා පරිසරය සමග සමීපව සම්බන්ධවී ඇත. සතුන්, වනාන්තර, ගංගා, දේශගුණය සහ ස්වාභාවික සම්පත් යන සියල්ල සෑමවිටම මානව ඉතිහාසය හැඩගස්වා ඇත.

## 3. මානව කේන්ද්‍රවාදය සහ යටත් විජිතවාදය

යුරෝපීයානු රටවල් අප්‍රිකාවේ, ඇමරිකාවේ සහ ආසියාවේ භූමිය යටත් විජිතකරණය කළ විට, ඔවුන් ආයුධ සහ නීතිය පමණක් නොව මානව කේන්ද්‍රීය චින්තනය ද රැගෙන ආහ. කෙසේ නමුත්, මෙම මානසිකත්වය ස්වභාවධර්මයට පමණක් අදාළ වූවක් නොවීය. මන්දයත් යටත් විජිතවාදීන් භූමිය සහ මිනිසුන් යන දෙකම සම්පත් ගනයෙහිලා සැලකූහ.

මානව කේන්ද්‍රවාදය තුළ ස්වභාවධර්මය යනු මිනිසුන් සඳහා පවතින්නක් බව පවසන ආකාරයටම, යටත් විජිත චින්තනය තුළ යුරෝපීය බලවතුන්ගේ ලාබ ප්‍රයෝජනය සඳහා යටත් විජිතකරණය කළ මිනිසුන්, ඔවුන්ගේ ඉඩම් සහ

සතුන් පැවතුන බවට අන් අයට පෙනෙන්නට සැලැස්වීය.බොහෝ ස්වදේශික ජනයා යනු ශ්‍රමය ලබාගැනීමට, නැතිනම් තම පාලනයට යටත්ව සිටින හෝ තම දේපලක් ලෙස සිතීමට ඉන් බලකරන ලදී. එය පාලනය කළ යුතු තවත් එක් සම්පතක් පමනක් ලෙස සැලකීය.

මිනිසුන් ස්වභාව ධර්මයට වඩා උසස් යැයි විශ්වාස කළ ආකාරයටම තමන්ගේ ශිෂ්ඨාචාරය අනෙකාගේ ශිෂ්ඨාචාරයට වඩා උසස් බව යටත් විජිත වාදීන් විශ්වාස කළේය. යටත් විජිතකරණය වූ මිනිසුන් හට ඔවුන් සැලකුවේ, සොබාදහම මෙන් සූරාකෑමට ලක්විය යුතු දෙයක් ලෙසයි.

### 4. සත්ව ඉතිහාසයඃ මානව කේන්ද්‍රීය ලෝක දැක්මට සහ ඓතිහාසික චින්තනයට අභියෝග කිරීම.

සත්ව ඉතිහාසය පිලිබඳ අවධානය යොමු කිරීමේදී වටහාගතහැකි වන්නේ,එය මානව කේන්ද්‍රීය ඉතිහාසයේ සිටම ඉතිහාසය පුරා සතුන්ගේ ජීවිත සහ ඔවුන්ගේ භූමිකාවන් වෙත අවධානය යොමු කරන ඓතිහාසික අධ්‍යයන ක්ෂේත්‍රයක් බවයි. මෙකී ප්‍රවේශය තුළින් ඉතිහාසය පිළිබඳ සාම්ප්‍රදායික මානව කේන්ද්‍රීය දෘෂ්ටිකෝණයන්ට අභියෝග කරන්නේ, සතුන් යනු මිනිසුන්ගේ කතන්දරවල පසුබිමේ දැක්වෙන නිෂ්ක්‍රීය, වස්තූන් කොටසක් පමණක් නොව සමාජ, සංස්කෘතීන් සහ පරිසරයන් හැඩගැස්වීමේදී ක්‍රියාකාරීව දායකත්වය සැපයූ කොටසක් බව හඳුනා ගැනීමෙනි.

සත්ව ඉතිහාසය අද්‍යනයේදී අපට ගවේෂණය කළ හැකි ප්‍රශ්නඃ

- මිනිසාගේ ආර්ථිකයට ,යුද්ධයට සහ ගවේෂණයන්ට සතුන් බල පා ඇත්තේ කෙසේද?
- කාලය ගත්වීමත් සමඟ මානව-සත්ව සම්බන්දතා පරිණාමය වී ඇත්තේ කෙසේද?
- සංස්කෘතීන්, ආගම් සහ අනන්‍යතා පවා හැඩගැස්වීමේදී සතුන් ඉටු කර ඇති කාර්යභාරය කුමක්ද?

### 5. යටත් විජිත සංචාරකයින්ගේ ලේඛන සටහන්

යුරෝපීය යටත් විජිත කාල වකවානුවේදී, ගවේශකයින් සහ සංචාරකයින් නව භූමියන් ගවේශණය කිරීම සඳහා පිටත් විය. යුරෝපීයන් ලෝකයේ අනෙක් (කොටස්) රාජ්‍යන් තේරුම් ගත් ආකාරය සැලකිය යුතු මට්ටමකින් හැඩගස්වා ඇති ආකාරය ඔවුන්ගේ සංචාරක වාර්තා අධ්‍යනයේදී පෙනී යයි. නමුත් ගොඩනගා ඇති මෙම ආඛ්‍යානය මධ්‍යස්ථ එකක් නොවිණි .

ඇතැම් සංචාරකයින් වෙනත් සංස්කෘතීන් පිලිබඳ සැබෑම කුතුහලයකින් පසුවුනත්, ඔවුන්ගේ ලේඛන අධ්‍යනයේදී බොහෝ විට සූරාකෑම තුළ මුල් බැසගත් මානසිකත්වයක් හෙළිදරව් කළේය. ඔවුන් බොහෝ අවස්ථාවල ඉඩම්, මිනිසුන් සහ සතුන් යනු ඔවුන්ගේ ලාබය උදෙසා, පාලනය කිරීමට, තම යටතේ තබා ගැනීමට හෝ සූරාකෑමට නියමිත සම්පත් සමූහයක් ලෙස මේ ලේඛන තුළ නිරූපණය කර ඇත.

19 වන සිය වස වන විට කාර්මික ධනවාදය සහ යටත්විජිතවාදය එකිනෙකට ගැඹුරින් සම්බන්ධ විය.

- මෙකල යටත් විජිත තුළ රබර්,කපු,රත්තරන් හා ලාබ ශ්‍රමය යනු නිමා නොවන සම්පත් ලෙස සැළකුහ.
- විදේශීය සතුන් නිරීක්ෂණය කිරීම යන කාර්ය සඳහා පමනක්ම භාවිතා නොකළහ. ඉන් ඔබ්බට විදේශීයකරණයට ලක් කිරීම, අල්ලා ගැනීම, දඩයම් කිරීම, ශ්‍රමය සඳහා භාවිතා කිරීම හෝ

විද්‍යාත්මක පර්යේෂණ සඳහා හෝ සත්වෝද්‍යානවල ප්‍රදර්ශනය වැනි පොදු විනෝදාස්වාද අරමුණු සඳහා යුරෝපයට ප්‍රවාහනය කිරීම ආදී කටයුතු ද සිදු කරන ලදී.

අප මෙම යටත් විජිත සමයේ ලියැවී ඇති සංචාරක වාර්තා සටහන් වඩා හොඳින් සහ ප්‍රවේශමෙන් කියවා බලන්නේනම්, මෙම යටත් විජිත සූරාකෑමේ බලපෑම විසින් ඉතිහාසය හැඩගස්සවා ඇති ආකාරය සහ අද දවසේදී අප ලෝකය දකින ආකාරයට එය බලපැම් කර ඇති අයුරුද පැහැදිලිව වටහා ගත හැකිය.

### 6. අද දවසේදී මේ කාරණය වැදගත් වන්නේ ඇයි?

අද දවස වන විටද ලෝකයේ මානව කේන්ද්‍රීයවාදයේ සහ යටත් විජිත චින්තනයේ බලපෑම් පෙනෙන්නට තිබෙන අතර අපට තවමත් ඒවා අත්විදීමට ද හැකිය.

- බොහෝ පැරණි යටත් විජිත සතු සම්පත් විශාල ප්‍රමානයේ ගෝලීය කර්මාන්ත විසින් බලෙන් අත්පත් කර ගනිමින් සිටියි.
- බොහෝ විට තිරසාරභාවයට වඩා ලාබයට මුල් තැන දෙන අයුරක් දැකිය හැකි බැවින් එය පරිසරය විනාශ කිරීමේ මාවතකට ඇද දමා ඇත.
- ඇතැම් පුද්ගල කන්ඩායම් දෙස බැලීමේදී පෙනී යන කරුනක් නම් ඔවුන් තවමත් ගෞරවය සහ අයිතිතිවාසිකම් හිමි පුද්ගලයින් ලෙස නොව, අඩු මුදලකට ශ්‍රමය සපයා ගත හැකි මූලාශ්‍රයක් ලෙස සලකන බවයි.
- සතුන් තවමත් විද්‍යාත්මක පර්යේෂණ, පොදු විනෝදාස්වාදය සපයන කටයුතු සහ මිනිසුන්ගේ තත්ත්වය පෙන්නා ගැනීමේ සහ කීර්තිනාමය වැඩිකර ගැනීමේ සංකේතයක් ලෙස භාවිතා කරයි.
- බොහෝ අවස්තාවලදී අප යටත් විජිත වාදය විවේචනයට ලක්කරමින් සිටිනවා. නමුත් මානව කේන්ද්‍රීය චින්තනය යන කාරනාව දෙස හැරී බැලීමේදී, එය තවමත් ප්‍රශ්න කිරීමට පටන් ගෙන ඇති බව පමනක් පෙනීයනවා. ඉතිහාසය පුරා සිදුවූ දේවල් හා එහි රටාවන් හඳුනා ගැනීම අපට සාධාරණ, සදාචාරාත්මක සහ තිරසාර අනාගතයක් ගොඩනගාගැනීමට උපකාරී වෙයි.

## සැමුවෙල් වයිට් බේකර් සහ ඔහුගේ සංචාරක වාර්තා සටහන් පිළිබඳ හැඳින්වීමක්

The Rifle and the Hound in Ceylon (1853) (ලංකාවේ රයිෆලය හා දඩබිබරයා) සහ Eight Years' Wanderings in Ceylon (1855) ( ලංකාවේ අවුරුදු අටක සංචාරයන්) යන ග්‍රන්ථයන් හී කතුවරයා වන සැමුවෙල් වයිට් බේකර් යනු කීර්තිමත් ක්‍රීඩකයෙක්, ගවේෂකයෙක් සහ යටත් විජිත නිලධාරියෙකි. 1821 දී ලන්ඩනයේ උපත ලැබූ බේකර් පසුව මොරිෂස් වෙත සහ ඊටත් පසුව ලංකාව(සිලෝන්) වෙත (වර්තමාන ශ්‍රී ලංකාව)[3] සංක්‍රමණය විය.

[3] 1948 දී බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස ලබා ගැනීමෙන් පසු, 1972 දී මෙරට ශ්‍රී ලංකාව ලෙස නම් කරන ලදී.

ඔහුගේ පුළුල් සංචාරයන් ලංකාවට පමනක් සීමාවුවක් නොවීය. ඉන් ඔබ්බටද මැද පෙරදිග, සුඩානය, ඊජිප්තුව සහ අවසානයේ වර්තමාන වයඹදිග උගන්ඩාව දක්වා ව්‍යාප්ත විය. එහිදී, නයිල් ගඟේ මූලාශ්‍ර සොයා ගැනීම සඳහා ඔහු දැක්වූ දායකත්වය නිසා 1866 දී ඔහුට නයිට් පදවියක් හිමි විය.

The Rifle and the Hound in Ceylon සහ Eight Year's Wanderings in Ceylon යන කෘති දෙකම ජනවාර්ගික දැක්මක් හරහා ලංකාවේ භූගෝලීය පිහිටීම අනුව සමාජීය හා ආර්ථික සාධක අතර අන්තර් ක්‍රියාකාරීත්වය සහ ස්වාභාවික ඉතිහාසය පිළිබඳ අවබෝධයක් ලබා දුන්නද, එහි ප්‍රධාන අවධානය යොමුව ඇත්තේ එකල බේකර්ගේ දඩයම් ගවේෂණ සහ ඔහුගේ ක්‍රීඩාව පිළිබඳ සවිස්තරාත්මක නිරීක්ෂණ වෙත ය. විශේෂයෙන්, Eight Years' Wanderings in Ceylon කෘතියේදී බේකර් වඩාත් පරිණත ආඛ්‍යාන ස්වරූපයක් අනුගමනය කරන අතර, මුල් කාලයේ කොළඹ සම්බන්ධයෙන් ඔහු තුළ වූ උනන්දුව,උද්යෝගය අඩුවීම නිසා දඩයම් කිරීම කෙරෙහි වන නොනිමි අශාව වෙත ඔහුව මෙහෙය වනු ලැබීය. මේ හේතුවෙන් ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකර ප්‍රදේශයක් වන නුවරඑළියේ ඔහුගේ පවුල සමඟ ජනාවාසයක් ස්ථාපිත කළ ආකාරය මෙහිදී විස්තර කරයි. දඩයම් කිරීම සඳහා බේකර් තුළ තිබූ මෙම පෙළඹීම නිසා ඔහුගේ සංචාරයන් හා ජනාවාස හැඩගැස්සීම පමනක් නොව, Eight Years' Wanderings in Ceylon කෘතිය පුරා සතුන් පිලිබඳ ඔහු තුළ වූ විචිත්‍රවත් දැක්මද පෙන්නුම් කර ඇත. ඔහුගෙ සංචාරක සටහන් පොතේ සතුන් පිලිබඳ එක් රැස් කර ඇති තොරතුරු වළ ගෘහාශ්‍රිත සතුන් සහ වනජීවී සතුන් යන විශේෂ දෙකම පිළිබඳ සටහන් කර ඇත. මුල් කාලීන සමය තුළ කොලඹ ප්‍රදේශයේ දවල් කාලයේ ඇවිද ගිය ගොන්නු(හරක්) පිලිබඳ ඔහුගේ නිරීක්ෂණයන්ගේ සිට දිවියන්, ඌරන්, ගෝනුන්,කිඹුලන්,කුඩැල්ලන් මෙන්ම පුළුල් පරාසයක විහිදුනු පක්ෂීන්,කෘමීන් මෙන්ම භූමිය තුළ වෙසෙන අනෙකුත් සතුන් දක්වාද විහිදී ඇත. මේ අතරිනුත් ආකර්ශණීය, ලුහුබැඳ යාමට පොලඹවන සහ තමන් සතු කරගැනීමට වටිනා වස්තුවක් ලෙස මුල් වී ඇති අලි ඇතුන්, අනෙක් සතුන්ට සාපේක්ශව බේකර්ගේ වැඩි අවධානයකට ලක් වී ඇත. බේකර්ගේ ආඛ්‍යානය තුළ සහ මෙම අධ්‍යයන මාර්ගෝපදේශය යන දෙකෙහිදීම අලි ඇතුන්ට විශේෂ අවධානයක් ලබා දී ඇති අතර, ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලයක සත්ව ඉතිහාසය තුළ අත නොපෙවූ,බොහෝ විට නොසලකා හරින ලද ගමන් මාර්ගයක් හෙලි දරව් කරගැනීම සඳහා යටත් විජිත සමයේ ශ්‍රමය වැගිරූ, ප්‍රදර්ශන භාන්ඩයක් ලෙස, සිහිවටන සඳහා මෙන්ම වෙලඳ භාන්ඩ ලෙස ද භාවිතා වූ සත්ව කොට්ඨාශයක් ලෙස අලි ඇතුන් පිලිබඳ පුළුල් විග්‍රහයක් අත්‍යවශ්‍ය ය.

# කෙටි උපුටා ගැනීම්

### උපුටා ගැනීම 01: බර වැඩ කිරීම සඳහා යොදා ගන්නා තිරිසන් සතුන් ලෙස අලි ඇතුන්

නුවරඑළියට පැමිණීමෙන් පසුව, බේකර් "සඳ තැන්න" එළිපෙහෙළි කර වගා කටයුතු කිරීමට පටන් ගත් හ. මෙහිදී නගුලක බඳින ලද අලියෙක් දැකීම වැනි අසාමාන්‍ය දර්ශනයකට මුහුණ දෙන බේකර්, මෙම ගෘහාශ්‍රිතව හැදෙන අලියාට පවරා ඇති වෙහෙසකර වැඩ කොටස එම සතා විසින් කර නිම කරන ආකාරය හා එම සූක්ෂම ක්‍රියාවලිය මෙහිදී විස්තර කරයි.

ගොවියා ගොනුන් විස්සක පමණ කන්ඩායමක් එකතු කරගෙන වගා බිමේ කරනු ලබන වැඩ කොටස, සද්ධන්ත අලියෙක් විසින් තනිව වගා බිමේ කරන වැඩ කොටස හා සසඳන විට ඉතා කුඩා කාර්යකි. පිහියකින් ඇපල් ගෙඩියක් ලෙලි ගහනවා මෙන්, පොලොවේ ශක්තිමත් ලෙස මුල් බැසගත් තණකොළ ඌ පහසුවෙන් ගලවා දැමීය. බීජ බූමියෙහි පැල වීමට පටන් ගන්නා අවධියේදීද මෙම අලියාම වෙන කණ්ඩායම් තුනක කාර්යන් තනිවම කරන ආකාරය දැකීම විනෝද

ජනක ක්‍රියාවකි. ඇය පස් පෙරලීමට හැකි බර යන්ත්‍ර යුගලයක් පලමුව පැලඳ ගන්නා අතර,සැහැල්ලු යන්ත්‍ර යුගලයක් ද ඊට පසුපසින් එයටම සම්බන්ධ වී තිබූ අතර ,අදින විට පසු පසින් කැරකෙමින් එය ඉදිරියට ගමන් කරයි. මේ අනුව පොලොවේ පස පෙරලීමේ කාර්යයේ පලමු අදියර හා දෙවන අදියර අවස්ථා දෙකකදී නොව එකම වෙලාවකදී කර ගැනීමට හැකි විය.

මෙම අලියා ඉතාම විචක්ෂණශීලී බුද්ධියකින් යුතු සතෙක් වූ අතර ගොවිතැන් කටයුතු වලට අදාල වැඩ කොටස අවසන් කළ පසු ඇළ මාර්ගයක් හරස් කර වේල්ලක් බැදීමේ ක්‍රියාවලියක නිරත වූවාය. ඇය ඉතා විශාල සතෙකු වූ අතර වේල්ල සෑදීමේ කාර්ය සඳහා අවශ්‍ය වන විශාල බර දැව කඳන් ඔසවාගෙන යමින් වේල්ල බැදීමට ඒවා දක්ෂ ලෙස සකස් කරන ආකාරය දැකුම්කලුය. මෑතකදී වනාන්තරයෙන් කපා දමන ලද රලු ගස් කදන්, වේල්ල සකස් කරන ස්ථානයේ සිට යාර පනහක් ඇතුලත දමා තිබූ අතර,වේල්ල සඳහා අවශ්‍ය මෙම කඳන් අඩි පහළොවක් පමණ දිගින් සහ අඟල් දහහතරක් හෝ දහඅටක පමණ විෂ්කම්භයකින් යුක්ත විය. ඇය මෙම කඳන් මුඛය තුළ රඳවා ගෙන රැගෙන ගිය අතර, ලී කොටය සමබර වන තෙක් එහි ග්‍රහණය එහා මෙහා කිරීමෙන් අනතුරුව කොටය ඔසවා ගනියි. පසුව ඇගේ හොඬ වැලෙන් ස්ථාවර ලෙස එය අල්ලා,සෑම ලී කොටයක්ම එම ස්ථානයට රැගෙන ගොස් ඇළ හරහා සමාන්තර පේලි වලට තැබීම සිදු කළාය.මිනිසෙකුගේ මග පෙන්වීම යටතේ ඇය මෙම කාර්යයේ නිරත වූවාය.

ඇගේ මෙම කාර්යයේ සුවිශේෂීම කොටස වූයේ දැවැන්ත රත් හදුන් කොට දෙකක් (බරින් වැඩිම දැව කදන් වර්ගයක්) වේල්ල සැකසීමේ කාර්යට යොදා ගැනීමයි. මේවා අඩි දහඅටක් පමණ දිගකින් සහ අඩි දෙකක පමන විෂ්කම්භයකින් යුක්ත වූ අතර, ඒවා ඇළේ එක් ඉවුරක ,ඇළට සමාන්තරව සහ ඉවුරේ ගැට්ට ආසන්නයේ වන්නට තබන ලදී. ඇය නියමාකාරයෙන් නිශ්චිත ස්තානවල ප්‍රවේශමෙන් මේවා තැබුවේ කිසිවකුගේ සහයක් නොමැතිවය. තම හිසෙන් මේ කොට මෘදු ලෙස පෙරලා,පසුව එක් පාදයක් හා හොඬ වැල ලී කොටයට ප්‍රතිවිරුද්ධ පැත්තේ තබාගෙන ඇලට ගෙන යන හැම අවස්ථාවකම  කොටයේ බර හා වේගය හසුරුවා ගනිමින්, එය ගමන් කරන මාර්ගය ගැන පරික්ෂාකාරී වූවාය. කාර්ය මනාලෙස නිම කළ බව මම හිතුවත් ඇය ඉන් සෑහීමකට පත් වුනු බවක් නොපෙනිණි. ඇය දැන් ඇළ මාර්ගයට ගොඩවී අවසාන වශයෙන් ලී කොටයේ කෙළවර හිසෙන් තල්ලු කොට කාර්ය නිම කළාය. ගස් කොටන් දෙක එකිනෙකට හරියටම සමාන්තරව,ඇළ ඉවුරු දෙකේම කෙළවරට ආසන්නව මනාව පිහිටා තිබුණි.

## උපුටා ගැනීම 02: අලි දඩයම

මඩකලපුවට සැතපුම් හැටක් පමණ දකුණින් පිහිටි කුඩා ගම්මානයක් වන ගොල්ලගන්වෙල්ලෙවේ හි පිහිටි වැවකට උදෑසන කාලයේ ආක්‍රමණය කරන අලිරංචුවක් ගැන ස්වදේශික ජනයාගෙන් අසා දැනගන්නා බේකර් සහ එෆ්.එච්. පැලිසර්, එකළ ලංකාව යටත් කරගැනීමට අවි එසවූ ඔහුගේ මිතුරු කන්ඩායමක් හා ගැමියන් විසි පස්දෙනෙකුගෙන් යුතු කන්ඩායමක් ද සමගින් අදාල ස්ථානයට ලඟා වූහ. අලි රංචුව සිටි ස්ථානයට ලඟා වූ පසු ගම් වැසියන් කෑ කෝ ගසමින්, ඔවුන්ව ව්‍යාකූල කරමින් බේකර් සහ දඩයම් කිරීමට බලා සිටින තුවක්කුකරුවන් දෙසට පලවා හරියි.

මේ අතරතුර මහා වතුර කදම්බයක් කඩාහැලෙන හඬක් මෙන්, විශාල සතුන් විශාල ප්‍රමානයක් එකවර වේගයෙන් ගමන් කරන නිසා ඇතිවන ඝෝෂාවක් වඩ වඩා ලංව ඇසෙන්නට විය. අලි රංචුව පැමිනෙණ විට දෙපැත්තටම අණදීමට හැකිවන අයුරින් මම ත්,පැලිසර් ත් ස්ථානගතවී සිටියා. අපගේ තුවක්කු කරුවන් අප පසු පසින් ඇති ගස්වලට මුවා වී බලා සිටියා. මේ අතර ගම් වැසියන් මෙහි ඇති විනෝද ජනක බව සම්පූර්ණයෙන් පසෙකලා,වඩා බැරෑරුම් ලෙස මෙය ගනිමින් ,ගස් අතු කඩමින් වානරයින් මෙන් හැසිරෙන්න පටාන් ගත්තා. අවිනිශ්චිත භාවයෙන් ගතවුනු මිනිත්තු කීපයකට පසු විශාල ඝට්ටනයකින් හා දිය පහරක් කඩා වැටෙන විට ඇතිවන මහා ඝෝෂාවක් වන්ව අලි ඇතුන් අප

සිටි ස්ථානයට ආසන්න වී සිටියා. විශාල අලි ඇතුන් විසින් මෙහෙයවනු ලැබූ අලින් ,බලවත් ආරක්ශක සේනා වලල්ලක් ලෙස සිටිනු අපට වෙන්ව හදුනා ගත හැකි වුනා. අප අතර යාර සීයකවත් දුරක් නොතිබුනු අතර ඔවුන් අප සිටි දෙසටම කඩාපාත් වුනා. මෙන්න මේ වෙලාවෙ අපි වාසනාවන්ත වුනා. නිහඬවම අපේ මොහොත පැමිනෙන තෙක් රයිෆල් ඔසවාගෙන බලා සිටින විට අප දෙදෙනාගේම මුහුනුවල තෘප්තියට පත්වුනු ආකාරයේ, දරුනු සහ මිනීමරු සිනාවක් ඇදී තිබුනා. ඔවුන්ට පහරදීමට ඉක්මන් වීමට පෙර අලි රංචුවෙන් අඩකට පමන අප පසුකර යාමට ඉඩ දීම අපගේ අභිප්‍රාය විය. මන්ද එවිට අපි, අලි රංචුවේ මැදට වන්නට රැදී සිටින නිසා ඔහුට ඉතාමත් හොදින් මෙන්ම වේගවත් වෙඩි තැබීමකට අලියකු ඉලක්ක කර ගත හැකිය.

මඩ වතුර හොඬ වැලෙන් විසිකරමින්,නිර්භීත ස්වබාවයකින් අලි රංචුවක් අපි සැගවී සිටි දෙසට එක එල්ලේ එන්න පටන් ගැනුණි. ඔවුන් අපට යාර විස්සක් පමන දුරින් සිටි අතර ඒ වන විටත් අපව සොයා ගත නොහැකිව කුරිරු වැටී සිටි ගම් වැසියන් ගස් මතට නැග සිටි අතර අලි ඇතුන් වඩා ලංවීම හේතුවෙන් හටගත් බියෙන් ඔවුන් තවත් ඉහළට නැග ගත්හ. මේ කලබගෑනිය හේතුවෙන් රංචුවේ සිටි වැඩිහිටි අලින්ට අනික් අලින් අනතුරු අඟවන්න පටන් ගත්හ.

මේ වෙලාවෙ මට පිටු පසින් අලි ඇතුන්ගේ දැවැන්ත ගර්ජනාවක හඬක් ඇසුනු අතර, වැවේ සිට තවත් අලි ඇතුන් කොටසක් මෙදෙසට පැමිනෙනවායැයි මා බලාපොරොත්තු වුනා. ඒ නිසා මම හැකි ඉක්මනින් හිස් වූ රයිෆල් වලට නැවත උන්ඩ පුරවා එම ස්ථානයට දිව ගියා. ගර්ජනා හඬ දිගටම නොවෙනස් වී පැවතුනා. මා නැවත පැමිණීමේදී අලි රංචුවක් මුණගැසේයැයි බලාපොරොත්තු වුනත්,අඩි හතරක් පමණ උස තරුණ අලියකු පමණක් සොයා ගැනීම හේතුවෙන් මගේ බලාපොරොත්තු බිඳ වැටුනි. පසු බැසීමේදී තම කන්ඩායමෙන් වෙන් වී සිටි මෙම අලියා වෙන්වුනු කන්ඩායමේ සාමාජිකයින්ට ගර්ජනා කරමින් අඬගැසීය. මේ තරුණ අලින් ඕනෑවට වඩා මෝඩ හා හිතුවක්කාර සතුන් බව කියමින් මා නැවත පැමිණි මොහොතේ චෝදනා ස්වරූපයෙන් ඔහු මට පවසන්න විය. අලියාට වෙඩි තැබීම පසෙකලා මම රයිෆලය බිම තැබූ විට, කැරසි හැර අනෙක් තුවක්කුකරුවන් තම රයිෆල් සෙමින් බිම තබා කුරිරු වදුරු රංචුවක් මෙන් ගස් දිගේ උඩට නැග ගත්හ. මම තරුණ අලියගෙ එක පැත්තකට පැනලා වලිගයෙන් අල්ල ගත්තා.මට අල්ලගෙන ඉන්න බැරි තරම් ඌ ශක්තිමත්. මම මගේ විලුඹ හොදින් බිමට තද වන ලෙස තබා මුලු වැර යොදා ඌව අල්ලගෙන හිටියත් මාවත් ඇදගෙන ඌ වනාන්තරය හරහා දුවන්න පටන් ගත්තා. මේ වෙලාවෙ කැරසි මගේ උදව්වට ඇවිත් අලියගෙ වල්ගෙන් අල්ල ගත්තා. නමුත් වාෂ්ප එන්ජිමකින් දුම්රිය මැදිරි ඇදගෙන යන ආකාරයට ඌ අපිවත් ඇදගෙන දුවන්න පටන් ගත්තා.

## උපුටා ගැනීම 03: වෙළඳ භාණ්ඩයක් ලෙස අලි ඇතුන්

බේකර් විසින් එක් පසෙකින් යටත් විජිත රජයේ ආර්ථික ප්‍රතිපත්තිය විවේචනය කරන අතරම අනෙක් පසින් දඩයම් කරන ලද සතුන්ගේ මළකඳන් වටිනා අපනයන භාන්ඩ බවට පරිවර්තනය කිරීමට ස්වදේශික ජනයා දිරිමත් කළ යුතු ආකාරයද විස්තර කරයි.

දිරාපත් වීමට අතැර පසෙකට දමා ඇති ලක්ෂ සංඛ්‍යාත සත්ව හම්(සම්) සංරක්ෂණය කර අපනයනය කළ හැකි නමුත් එය වර්තමානයේ ලුනු වල මිල අනුපාතය නිසා කරගැනීමට අපහසුව ඇත. ලංකාව තුළ වටිනා කමක් නැති වුනත් මී හරකුන්, ගොනුන්, මුවන්, ඌරන්, වැනි සත්වයින්ගේ 'හම් සඳහා ලෝකයේ අනෙක් ප්‍රදේශවල ඉහල වටිනා කමක් තිබේ. වෙඩි තබා මරා දැමූ වල් මී හරකුගේ හම පවා මෙහි ප්‍රයෝජනයකට නොගනියි. ඇට මිදුළු ලබාගැනීමට□ සුප් සඳහා වල්ගය ලබා ගැනීමට, මොළය එලියට ගෙන හකුපාඩා අතර ඇති මස් ආහාරයට ගැනීමට සහ දිව ලුනු දමා තබාගැනීමට වැනි දේට මැරූ සතා ප්‍රයෝජනයට ගනියි. ඉතිරි සියල්ල හිවළුන්ට ආහාරයට ගැනීමට අතැර යයි. ස්වදේශිකයන් යනෙන මග තොටේදී ඉතිරි වූ දිරා නොගිය 'අං හමු වූ විට ඔවුන් ඒවා රැගෙන ගොස් ඉංග්‍රීසි

වෙළඳ පොළට ඇතුල් වීමේ මාර්ගයක් ලෙස භාවිතා කරයි. නමුත් ඒ තුළ සැඟවී ඇති වටිනාකමින් යුතු එකම කොටස නොසළකා හරියි.

ලුනු ලේවායවල් වල සිට කෙටි දුරක් ඇතුලත මී හරකුන්, උඟරන් ඇතුළු සියළු වර්ගවල සතුන් බහුලව සිටින අතර, හම්වලින් මුදල් උපයා ලාබ ලැබිය හැකි බව ස්වදේශිය ජනතාවට ඔප්පු කළහොත්,ඔවුන් ඒ සඳහා ඉක්මනින්ම සූදානම් වන ක්‍රමය ඉගෙන ගන්නා බවට මට කිසිම ආකාරයක සැකයක් නැත. රටේ දකුණු වෙරළ තීරයේ වෙසෙන ස්වදේශික ජනතාවගේ පුරුදු වල විශාල වෙනසක් මම අත්දැකීමෙන් දැක තිබෙනවා. ගාල්ලේ වාශ්ප නැව් දිනපතා නැව්ගත කළ දා සිට ඒ හැඩ ගැසීමට වෙනස් වීම තුළින් මෙය දැකිය හැකියි.

අලියෙකුගේ හක්කෙ දතෙහි බර සාමාන්‍යයෙන් රාත්තල් හතක් පමන වෙයි. රාත්තලක වටිනාකම සතයක සිට පැන්ස තුනාමාරක් දක්වා නොවටියි. කෙසේ නමුත් දැන් වනවිට ඒවා විශාල වශයෙන් ගාල්ලට ගෙනෙනු ලබන්නේ පිහි මිටවල් හා විවිධ ආභරණ හදමින්, වාශ්ප නැව් මගින් ගාල්ලට එන මගී ජනතාව ඒවා ගැනීමට පෙලඹවීම සඳහාය. ස්වදේශිකයන්ට මේ අමාරු කාර්ය මගින් අත්වන්නේ සුළු ප්‍රතිපලයක් නම්, කෙටි ආදායමක් නම්, දැනට නාස්ති වෙමින් යන ඊට වඩා වටිනාකමක් ඇති "සම්" වෙළඳපොළ වෙත ගෙන ඒමෙන් වටිනා අපනයන භාණ්ඩයකට මග විවර වනු ඇතැයි සිතීමට හේතුවක් සෑම අතකින්ම පෙනෙන්නට තිබේ. ලුනු සර්ලන මිලකට ලබා ගත හැකිනම් සම් සකස් කර විකිණිය හැකියි.

### උපුටා ගැනීම 04: භයානක තිරිසන් සත්වයෙකු ලෙස අලියා

"රයිෆල් ඇන්ඩ් ද හවුන්ඩ්" කෘතියේ පහත උපුටා ගැනීමේ දී බේකර් "රතමහත්මයාගේ කතාව" තුළින් විස්තර කරන්නේ "රාක්ෂයකු" ලෙස හදුන්වන කුප්‍රකට තක්කඩි අලියෙක් පිළිබඳ අතිශෝක්තියෙන් ගොඩනැගූ කතාවකි. රාක්ෂයෙක් බදු මේ අලියා තම බිරිඳගේ මියගිය ශරීරයේ කොටස් කුරිරු ලෙස වෙන්කර,ඒවා කෑදර ලෙස ගිල දැමීමේ පුවතින් කම්පනයට පත්වන ඇගේ සැමියා විසින් මේ අලියාගෙන් එල්ලවන තර්ජනය නවතා ඌව විනාශ කිරීම සඳහා දක්ෂ අලි දඩයම්කරුවන් සිය දෙනෙකුගෙන් යුත් දඩයම් කණ්ඩායමක් එක්රැස් කරයි.

ඔවුන් මෙම තක්කඩි, මුර්ග අලියා සැඟව සිටින කුඩා වනාන්තරය දෙසට ගමන් කරයි. ඔවුන්ගේ කැමැත්තට ඉඩ දී, ඔවුන් අපේක්ෂාවෙන් මග බලා සිටි මේ අලියා උගේ ගුහාව තුළ ඔවුන් පියවර සීයක් ගමන් කිරීමට මත්තෙන් දරුණු ලෙස කෝපාවිශ්ටව එළියට පැමිණෙයි. දෙපිරිස අතර ඉතා උද්‍යෝගිමත් ආකාරයෙන් ගැටුම ආරම්බ විය. හෙල්ල අත දරා සිටි පිරිස ඉදිරියෙන් සිටි අතර පොරෝ අත දරා සිටි මිනිසුන් කණ්ඩායම් දෙකකට වෙන්ව සිටියහ. කණ්ඩායම් දෙකෙහිම එක සමාන ප්‍රමානයෙන් ලනු රැගත් මිනිසුන් රැඳී සිටියහ. මුළු මිනිස් කණ්ඩායමම ඔහුට පහරදීමට දිව එන විට ඔහු සිය උපරිම වැර යොදා වේගයෙන් මිනිසුන් ඉදිරියට දිව ගියේය. මිනිසුන් සියගනනක් කෑ ගසා කඩාපැන්නත් ඔහු ඔවුන් ඉදිරියේ නොසැළී කෝපාවිශ්ටව දරුණු ආකාරයෙන් ප්‍රහාරය නොනවත්වා කරගෙන ගියේය. මේ අතර හෙල්ලකරුවන් යාර විස්සක් පමණ තිබියදී නතර වී බලා සිටින්න විය. ඉන් පසු හැරී පලා යන්නට විය. මෙය කලින් කතා කරගත් සැලසුමකට අනුව විය. දිව යන සතුරා ලුහු බැඳීම

සඳහා අලියා පොරෝ අතින් ගත් මිනිසුන් කන්ඩායම් දෙක පසු කරමින් දිව යන්නට විය. ක්ෂණිකව ක්‍රියාත්මක වූ පොරෝ අත දරා සිටින මිනිසුන් කන්ඩායම, විපතට පත් කාන්තාවගේ සැමියාගේ මෙහෙයවීමෙන් අලියා ලුහු බඳින්න විය. පළිග ැනීමේ චේතනාවෙන් සිටි මේ මිනිසා කෙලින්ම අලියාගේ පසු පස පාදයට එල්ල කළ ප්‍රහාරයෙන් ඔහුගේ පාදයේ ඉහලින් ඇති පලමු සන්ධි නහරය බිඳී ගියහ.(මෙය ලියූ දිනයේ පටන් "අබිසීනියාවේ නයිල් අතු ගංගාවල විස්තර කර ඇති


පරිදි" තියුණු කඩුවකින් එල්ල කර ඇති එක් පහරකින් අප්‍රිකානු අලියකු ආබාධිත බවට පත්ව සිටින ආකාරය මම දැක ඇත්තෙමි.) ඒ මොහොතේම අලියා දනින් වැටුනු නමුත්, ක්ෂණයකින් නැවතත් නැගිට තමා ලුහු බැඳ ආ මිනිසුන් දෙසට හැරුනේය. පොරෝ තල දුසිම් ගනනක් මතට හිරු එළිය වැටී ඒවා දිලිසෙන්නට වූ අතර එකෙනෙහිම අනෙක් පසු පස පාදයට පොරෝ පහරවල් එල්ල විය. එය ක්ෂණිකව සිදු වූ ක්‍රියාවක් විය.එකෙනෙහිම අලියාගේ දැවැන්ත ශරීරය බල රහිතව, ඉඳගෙන සිටින ආකාරයක් විදහා දක්වමින් නැමී වැටුණි. සම්පූර්ණයෙන්ම අසරණව, අප්‍රාණිකව සිටියත් ඌ පිස්සුවෙන් මෙන් ගර්ජනා කරමින් සිටියේය. කඹ අත දරා සිටි මිනිසුන් ඔහුගේ කඳට හා හිස ප්‍රදේශයට තොන්ඩු සාදා විසි කළහ. ඔහු දැවැන්ත අරගලයක නිරත වුවත් එය නිශ්ඵල විය. ඔහුගේ කඳ හරහා දමා ඇති කඹවල එල්ලී සිටි මිනිසුන් මේ භයානක ආයුධය බල රහිත කළේය. මිනිසුන් තියුණු හෙල්ල පහරවල් ඔහුගේ පැත්තට නැවතත් එල්ල කළ අතර, බොහෝ නිර්භීත දඩයක්කරුවන් ඔහුගේ ශරීරයේ පිටුපසට ඇති බෑවුම් කොටසින් ඉහළට නගිමින් කොඳු ඇට පෙලට හා දැඩිව පිහිටි බෙල්ලට නොනවත්වා වේගයෙන් පොරෝ පහරවල් එල්ල කරන්නට විය. යෝධයෙකු ස්වරූපයෙන් සිටි සත්වයා පලිගැනීමේ චේතනාවෙන් ඔඳ වැඩී සිටි කාන්තාවගේ සැමියාගේ අවසන් පහරින් කොඳු ඇට පෙල බෙදී අකර්මන්‍ය වී ගියේය. විනාශකාරී සත්වයා තව දුරටත් ජීවත් නොවීය. මෙම ජයග්‍රහණය ලබා ගත්තේ මෙයට සම්බන්ධ වූ එකදු මිනිසෙකුගේ හෝ ජිවිතයක් අහිමිවීමකින් තොරවය. ස්වදේශික ජනයා පැවසූ ආකාරයට මේ අලියා පිස්සු වැටුනු සතෙකි. (ඒ අනුව සාමාන්‍ය ශාක අනුභව කරන අලියකුට එහා ගිය මස් අනුභව කරන අලියකු යනු පිස්සු වැටුනු අලියකු ලෙස අර්ථ ගන්වා ගත හැකිය.) අලියෙකු මස් අනුභව කිරීම පිළිබඳ අප කිසිදා අසා නැති බැවින්, පිස්සු අලියෙකු යන්න යොදා ගනිමින් මස් අනුභව කිරීම යන කාරනයට සාධාරණ හේතුවක් සපයාගත හැකි වූවා විය හැකිය. අලි ඇතුන් හා මී හරකුන් යම් පුද්ගලයෙකුට පහර දීමට හේතු වන්නේ ඔවුන්ගේ කෝපය පමනි. මිනිසුන්ව ආහාරයට ගත යුතුයැයි යන සුළු අදහසක්වත් එහි ගැබ්ව නැත. මේ කතාවේ ප්‍රධානියා දිවුරා ප්‍රකාශ කරත් කතාවේ මේ කොටස විශ්වාස කළ නොහැකිය. විස්තර කර ඇති ආකාරයට අලියා, ගොදුර බවට පත් වූ මේ කාන්තාවගේ හිස පොඩිපට්ටම් කර කැබලිවලට ඉරා දමන්න හැකිය. නමුත් ආහාරයට ගත්තා යැයි කීම ඇදහිය නොහැකි තරම් කාරණයකි.

# ඇමුණුම 1: දෘශ්‍ය මූලාශ්‍ර

**කටු සටහන්/ අලි ඇතුන්ගේ දෘශ්‍ය මූලාශ්‍රඃ**

1. ජෑන් බ්‍රැන්ඩස් - සිතුවම් - https://rijkscollection.net/year/1785/263/NG-1985-7-2-92 - වැතිරී සිටින සිටින අලියෙකු සිංහලයන් කපනයුරු, අලියෙකු බව්තීස්ම කිරීම, අලි පදවාගෙන යාම

බ්‍රැන්ඩස්ගේ විවිධ අලි සිතුවම් වෙත ප්‍රවේශ වීමට, රිජ්ක්ස්මියුසියම් මාර්ගගත එකතුවෙන් සෙවුම් ක්‍රියාවලිය භාවිතා කරන්න, https://www.rijksmuseum.nl/en/collection, ඉහත මූල පදයෙන් සම්බන්ධ වන්න.




2. ශ්‍රී ලංකාවේ මහනුවර ප්‍රදේශයේ ජල නල එළීමට සහාය වන අලියෙක්.

ද ඉලස්ට්‍රටෙඩ් ලන්ඩන් නිවුස් (1856). අවසන් වරට ලබා ගන්නා ලද්දේ අප්‍රේල් 15 වන දින මේරි එවන්ස් පින්තූර පුස්තකාලය වෙතින් https://www.maryevans.com/search.php?prv=preview&job=5948470&itm=15&pic=11100619&row=4: උපුටා ගැනීම 1 ට අනුරූප වේ*





3. කල්කටාවේ නැව් පුවරුවකින් අලියෙකු ගොඩබෑම”, 1858 හාපර්ස් සතිපතා සඟරාවෙන්

https://commons.wikimedia.org/wiki/File:%22Landing_an_elephant_from_shipboard_at_Calcutta,%22_from_Harpers_Weekly,_1858.jpg (අවසන් වරට ලබා ගන්නා ලද්දේ 15 අප්‍රේල් 2025)




4. අ. ලංකාවේ අට වසරක සංචාරයන් හි කෘතියෙහි “රැළට පහර දීම” (පිටුව 239) යන මාතෘකාව යටතේ නිදර්ශනය 02 උපුටා ගැනීම සමඟ අනුරූප වේ. අවසන් වරට ලබා ගන්නා ලද්දේ 2025 අප්‍රේල් 15 https://archive.org/details/eightyearsinceyl00bake_0/page/n265/mode/2up?view=theater



ATTACK ON THE HERD

ආ. “ලංකාවේ අලි දඩයම”. නොදන්නා මූලාශ්‍රය, අවසන් වරට ලබා ගත්තේ 2025 අප්‍රේල් 15 https://www.shakariconnection.com/ceylon-hunting-books.html



5. පෙරහැර පෙරහුරුවේදී අලි ඇතුන්ට උක් දඬු ලබා දෙන කුමාරයා, මහනුවර, ලංකාව :INL, විශේෂ අතිරේකය, 1876 ජනවාරි 8*



6. අලි සෆාරි සඳහා දැන්වීම. තිර රුව https://www.midnightblueelephant.com/sri-lanka-safari-see-elephants-wild/ (අවසන් වරට ලබා ගත්තේ 2025 අප්‍රේල් 15)




7. 2014 මහනුවර ඇසළ පෙරහැර මංගල්‍යයේ අලි ඇතුන්. අවසන් වරට ලබා ගන්නා ලද්දේ 2025 අප්‍රේල් 15 https://en.wikipedia.org/wiki/Kandy_Esala_Perahera#/media/File:Perahera1.jpg



8. පින්නවල අලි අනාථාගාරයේ (2019) ස්නානය කරන අලි ඇතුන් නැරඹීම, අවසන් වරට ලබා ගන්නා ලද්දේ 2025 අප්‍රේල් 15 දින https://commons.wikimedia.org/wiki/File:Elephant_Bathing_in_Sri_Lanka.jpg

